දෙපාර්තමේන්තු කළමනාකරණ චක්‍රලේඛ ලිපි අංක :- 08/2019

මගේ අංකය : SG/ADMIN/SFA/4/Transfer/2020
මැනුම් ක්ෂේත්‍ර සහායක අංශය
මිනින්දෝරු දෙපාර්තමේන්තුව
කොළඹ 05

2019.05.

අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම/ක්ෂේත්‍ර/මානව සම්පත් හා පාලන/බිම් සවිය)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්
නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්
අධ්‍යක්ෂ (මැ.සි.ආ.- දියතලාව)/සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්
අධ්‍යක්ෂ (මුදල්)
සහකාර අධ්‍යක්ෂ(පාලන)
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්/ මිනින්දෝරු අධිකාරිවරුන්
ප්‍ර.කාර්මික හා පරිපාලන නිලධාරි/ කාර්මික හා පරිපාලන නිලධාරි
පරිපාලන නිලධාරි වෙත

**වාර්ෂික ස්ථාන මාරුවීම් - 2020**
**ශ්‍රී ලංකා මැනුම් ක්ෂේත්‍ර සහායක සේවය (ඕවසියර්වරුන් ඇතුළුව)**

මැනුම් ක්ෂේත්‍ර සහායක සේවය **III, II, I** හා **විශේෂ** ශ්‍රේණිවල මැනුම් ක්ෂේත්‍ර සහායකයින් සඳහා 2020 වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රාදේශීය හා මධ්‍යම ස්ථාන මාරු මණ්ඩලයක් පැවැත්වීමට කටයුතු කරගෙන යනු ලැබේ. මෙහි දී විශේෂ , I ,II, III ශ්‍රේණිවල මැනුම් ක්ෂේත්‍ර සහායකයින්ගේ නාම ලේඛනයන් වෙන වෙනම ලේඛනගත කර එවිය යුතුය. I ශ්‍රේණියේ මැනුම් ක්ෂේත්‍ර සහායකයින් (මැනුම් ඕවර්සියර්වරුන්) සේවය කරන ස්ථාන ද සඳහන් කර එවිය යුතු අතර මධ්‍යම මාරු මණ්ඩලය මඟින් ඔවුන් නව සේවා ස්ථාන වෙත අනුයුක්ත කරනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු වීම් පහත පරිදි වනු ඇත.

01. **ස්ථාන මාරුවීම් අයදුම් කිරිම සඳහා අදාල කොන්දේසි :-**

I. ප්‍රියමනාප සේවා ස්ථානයක අවම වශයෙන් වසර 03 ක් හෝ ඊට වැඩි කාලයක් සේවය කර තිබීම.
II. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක වසර 02 කට වැඩි කාලයක් සේවය කර තිබීම.
III. වර්තමාන සේවා ස්ථානයේ මුල් පත්වීම් දින සිට වසර 02 කට වඩා වැඩි සේවා කාලයක් සේවය කර තිබීම.
IV. කෙසේ වෙතත් දෙපාර්තමේන්තු අවශ්‍යතාවයට ප්‍රමුඛත්වය ලබාදීම සඳහා අවශ්‍යම අවස්ථාවන් වල දී ඉහත කොන්දේසිවලට පරිබාහිරව ක්‍රියා කිරීමට ද මධ්‍යම මාරු මණ්ඩලයට හැකියාවක් පවතී. (ඉහත කී කාලසීමාවන් 2019.12.31 දිනට ගණනය කරනු ලැබේ)

1.1 මැනුම් ක්ෂේත්‍ර සහායකයින්ගෙන් ලැබෙන ස්ථාන මාරු අයදුම්පත් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ප්‍රියමනාප හා ප්‍රියමනාප නොවන කොට්ඨාශ මධ්‍යම මාරු මණ්ඩලය විසින් තීරණය කරනු ඇත. මේ අනුව අවශ්‍යතාව වැඩි ඉල්ලීම් ලැබෙන කොට්ඨාශ ප්‍රියමනාප කොට්ඨාශ වශයෙන් ද සෙසු කොට්ඨාශ ප්‍රිය මනාප නොවන කොට්ඨාශ වශයෙන් ද සලකා කටයුතු කරනු ලැබේ.

1.2 පළාත්වලට අදාළ සෑම අයදුම්පතක් ම තම අධීක්ෂණ නිලධාරි මඟින්, අදාළ පළාත් සර්වේයර් ජනරාල් / අධ්‍යක්ෂ (මැ.සි.ආ.) වෙත ද ප්‍රධාන කාර්යාලයේ නම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන) වෙත ද 2019.06.28 දිනට ප්‍රථම ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු ය.

**02. මාරු මණ්ඩලයේ දී විශේෂ අවධානය යොමු කෙරෙන කරුණු :-**

වාර්ෂික මාරුවීම් ඉල්ලුම් කරන ලද අයට, ස්ථාන මාරුවීම් ලබාදීමේදී මාරු මණ්ඩලය විසින් පහත කරුණු කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු කරනු ඇත.

I. මැනුම් ක්ෂේත්‍ර සහායකවරයාගේ කැමැත්ත
II. මැනුම් ක්ෂේත්‍ර සහායකවරයාගේ පසුගිය සේවා විස්තර වාර්තාව
III. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය. (මේ සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබාදෙනු ඇත.)
IV. වයස අවු:53 ත් 55 ත් සීමාවන් හි සිටින මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්ට හැකිතාක් දුරට තමන් ඉල්ලා ඇති ස්ථානයක් ලබාදීමට කටයුතු කරනු ඇත. වයස අවු:55 සපුරා ඇති මැනුම් ක්ෂේත්‍ර සහායකයින් දැනට තම ගම් ප්‍රදේශයේ වසර 03 ක් සේවය කර ඇත්නම් හා ඔවුන් තවදුරටත් එම සේවා ස්ථානයේම තැබීම අපහසු නම් ඔවුන් මධ්‍යම මාරු මණ්ඩලය මඟින් මාරු කර යැවීමට කටයුතු කරනු ලැබේ.
V. වයස අවු.53 ඉක්ම වූ මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්ගේ වයස 55 දී විශ්‍රාම යන බවට තහවුරු කරන මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් වෙතොත් (අවු.55 දී විශ්‍රාම අපේක්ෂිත මැනුම් ක්ෂේත්‍ර සහායක විධිමත් විශ්‍රාම ඉල්ලුම් ලිපිය මේ සමඟ ඉදිරිපත් කළ යුතුය) ඔවුන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුව ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.
VI. වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කරනු ලබන දෙසැම්බර් 31 (උදා. 2020 වාර්ෂික ස්ථාන මාරු විම් සඳහා 2019.12.31 දිනට) අවු.58 ඉක්ම වූ මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුල වුවද මාරු නොකළ යුතුය.ජනප්‍රිය සේවා ස්ථානයන්හි සේවය කරන දෙසැම්බර් 31 වන දිනට වයස අවු.59 ඉක්මවූ මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් ද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරු නොකළ යුතුය.

2.1 එසේම උතුරු නැගෙනහිර පළාත්වලට ද සේවා අවශ්‍යතාවය මත අනුයුක්ත කිරීම් සිදු වනවා ඇත.

**03. මාරු මණ්ඩලය පැවැත්වෙන ආකාරය :-**

අදාළ මාරු මණ්ඩලය පහත සඳහන් අයුරින් පැවැත්වෙනු ඇත.

**3.1 දිස්ත්‍රික් මාරු මණ්ඩලය**

මෙය අදාළ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙනු ඇත. ඉදිරි වසර සඳහා දිස්ත්‍රික්කය තුළ රඳවා ගනු ලබන හා දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු කර යැවෙන අය පිළිබඳ නිර්දේශයක් ඉදිරිපත් කිරීම සඳහා මෙම මණ්ඩලය පැවැත්වේ.

**3.2 දිස්ත්‍රික් මාරු මණ්ඩල නිර්දේශ**

I. දිස්ත්‍රික් මාරු මණ්ඩලයේ දී ඉහත අංක 2 හි කරුණු පදනම් කරගත හැකි වන අතර ඒ අනුව දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරු ඉල්ලා ඇති අයගේ ඉල්ලීම් සම්බන්ධයෙන් මධ්‍යම මාරු මණ්ඩලයට අවශ්‍ය නිර්දේශයන් ඉදිරිපත් කරනු ඇත.

II. දිස්ත්‍රික් මාරු මණ්ඩලය විසින් පහත සඳහන් වාර්තාවන් මධ්‍යම මාරු මණ්ඩලය වෙත සැපයිය යුතු ය.

**(අ) අංක 01 ආකෘති පත්‍රය**
**ස්ථාන මාරු නිර්දේශ කරන :-**

වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය වසර 02 කට වැඩි, ස්ථාන මාරු වීමට කැමති මැනුම් ක්ෂේත්‍ර සහායකයින් සහ සේවා කාලය වසර 02 ට අඩු වෙනත් සාධාරණ හේතුන් මත ස්ථාන මාරු ඉල්ලන මැනුම් ක්ෂේත්‍ර සහායකයින්ගේ තොරතුරු පමණක් මෙම ලේඛනයට ඇතුළත් විය යුතු ය.

**ස්ථාන මාරු නිර්දේශ නොකරන :-**

වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය වසර 02 ට අඩු සියලුම මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්ගේ තොරතුරු පමණක් මෙයට ඇතුළත් විය යුතු ය.

ලැබී ඇති අයදුම්පත් අනුව දිස්ත්‍රික් මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරු නිර්දේශ කරන අයගේ උපලේඛනය හා මාරුවීම් නිර්දේශ කරනු නොලබන අයගේ උපලේඛනය අදාළ අයදුම්පත ද සමඟ එවිය යුතු ය. මෙම උපලේඛනය අංක 1 ආකෘති පත්‍රයට අනුව වෙන් වෙන්ව එක් එක් ශ්‍රේණිය සඳහා පිළියෙල කළ යුතු ය. (ඒ අනුව ආකෘති පත්‍ර අංක 1 න් වාර්තා 4 ක් එවිය යුතු ය.)

**(ආ) අංක 2 ආකෘති පත්‍රය**

ඉහත අංක 1 හි ආකෘති පත්‍රයට නම් ඇතුළත් නොවූ වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය වසර 03 ට වැඩි සියලුම මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්ගේ තොරතුරු පමණක් එක් එක් ශ්‍රේණිය සඳහා වෙන් වෙන්ව ප්‍රදේශයෙන් පිටතට අනිවාර්යයෙන්ම ස්ථාන මාරු කිරීමට සුදුසු අයගේ ලැයිස්තුවට ඇතුළත් විය යුතුය. ඒ අනුව අංක 2 ආකෘති පත්‍රය සකස් කර එවිය යුතු ය. (ඒ අනුව ආකෘති පත්‍ර අංක 2 න් වාර්තා දෙකක් එවිය යුතු ය.)

**(ඇ) අංක 3 ආකෘති පත්‍රය**

ඉහත අංක 1 හා 2 ආකෘති පත්‍රවලට නම් ඇතුළත් නොවූ දිස්ත්‍රික්කය තුළ සේවය කරන අනෙකුත් සියලුම මැනුම් ක්ෂේත්‍ර සහායකයින්ගේ නම් එක් එක් ශ්‍රේණිය සඳහා වෙන් වෙන්ව ආකෘති පත්‍ර 3 හි ඇතුළත් විය යුතුය. විශේෂ හේතූන් මත, එනම් ස්ථාන මාරු නියෝජිත, විශේෂ රාජකාරිවල නියැලෙන හා සැහැල්ලු රාජකාරියේ නියැලෙන දිස්ත්‍රික්කය තුළ තබාගත යුතු මැනුම් ක්ෂේත්‍ර සහායකයින් මෙම ආකෘති පත්‍ර අංක 3 ට ඇතුළත් විය යුතු අතර, එසේ තබාගැනීමට ඇති අවශ්‍යතාව පැහැදිලිව වෙනත් කරුණු යටතේ සඳහන් කළ යුතු ය.

උක්ත ආකාරයට විස්තර සඳහන් කිරීමේ දී දිස්ත්‍රික්කය තුළ සේවය කරන ඕනෑම මැනුම් ක්ෂේත්‍ර සහායකයෙකුගේ නම, ඉහත කුමන හෝ ලේඛනයකට අනිවාර්යයෙන් ම ඇතුළත් වී තිබිය යුතු අතර, ඕනෑම නමක් ඇතුළත් වී තිබිය යුත්තේ එක් ලේඛනයකට පමණි. ඒ අනුව නිවැරදි ලෙස පිළියෙල කරන ලද ආකෘති පත්‍ර එවීමට දිස්ත්‍රික් ස්ථාන මාරු මණ්ඩලය වගබලාගත යුතු ය.

**සැ.යු.** දිස්ත්‍රික් ස්ථාන මාරු මණ්ඩලය පැවැත්වෙන දිනට තම පළාත තුළ සිටින සියලුම මැනුම් ක්ෂේත්‍ර සහායකයින්ගේ නාම ලේඛනයක් (ඔවුන් සේවය කරන ස්ථාන හා එහි සේවා කාලය ඇතුළත්ව)අදාළ පළාත් සර්වේයර් ජනරාල් විසින් මා වෙත එවිය යුතු ය. (මෙය මාරු මණ්ඩල ආකෘති පත්‍රවලට අදාළ නොවන බව ද සැලකිය යුතු ය.)

**3.3 මධ්‍යම ස්ථාන මාරු මණ්ඩලය :-**

දිස්ත්‍රික් මාරු මණ්ඩලවලට අනුව අදාළ පළාත් සර්වේයර් ජනරාල් වෙතින් ලැබෙන ස්ථාන මාරු අපේක්ෂිත අයදුම්පත් ලේඛනය සහ අනිවාර්ය මාරු ලැයිස්තු ද මෙම මධ්‍යම මාරු මණ්ඩලයේ දී සලකා බැලෙනු ඇත. මධ්‍යම මාරු මණ්ඩලයේ තීරණ අදාළ අයදුම්පත් ද සමග ආපසු පළාත් මාරු මණ්ඩලය වෙත යැවෙනු ඇත.

**3.4 පළාත් මාරු මණ්ඩලය :-**

මධ්‍යම මාරු මණ්ඩලයේ තීරණය අනුව ඉදිරි වර්ෂය සඳහා එක් එක් පළාතකට අනුමත කාර්ය මණ්ඩලය පළාත තුළ ස්ථාන ගත කිරීම මෙම මණ්ඩලයේ දී යළි සලකා බලනු ඇත. ඒ අනුව ඒ ඒ අය අනුයුක්ත කළ යුතු කොට්ඨාශය / දිස්ත්‍රික්කය, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරින් සමග වූ පළාත් මාරු මණ්ඩලය විසින් නිශ්චය කරනු ඇත.

04. අභියාචනා මණ්ඩලය :-

අභියාචනා අවස්ථාවේ දී පහත කරුණු සම්බන්ධයෙන් සලකා බලනු ඇත.

I. යෝජිත මාරු කිරීම, මාරු මණ්ඩල ප්‍රතිපත්තින්ට පටහැනි වන අයුරින් අසාධාරණ ආකාරයෙන් සිදු වී ඇත්ද යන්න

II. ස්ථාන මාරුව නිර්දේශ කළ දිනට පසුව ඇති වූ විශේෂයෙන් සලකා බැලිය යුතු අපහසුතාවන් බරපතල පෞද්ගලික දුෂ්කරතාවන් ඉදිරිපත් කර ඇති ද යන්න

III. විශේෂිත සේවා අවශ්‍යතාවන් ඇත් ද යන්න

05. අයදුම්පත් ඉදිරිපත් කිරීම හා ස්ථාන මාරු කාල සටහන්

සියලුම අයදුම්පත් අමුණා ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ යුතුය.

| | |
|---|---|
| අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය | : 2019.06.28 |
| දිස්ත්‍රික් මාරු මණ්ඩල පැවැත්වීමේ අවසාන දිනය | : 2019.07.31 |
| මධ්‍යම මාරු මණ්ඩල පැවැත්වීමේ අවසාන දිනය | : 2019.09.09 |
| මධ්‍යම මාරු මණ්ඩල තීරණ ක්ෂේත්‍රයට දන්වා යවන අවසාන දිනය | : 2019.09.23 |
| පළාත් මාරු මණ්ඩලය පැවැත්වීමේ අවසාන දිනය | : 2019.10.07 |
| අභියාචනා ප්‍රධාන කාර්යාලය වෙත ලැබිය යුතු අවසාන දිනය | : 2019.10.31 |
| අභියාචනා මණ්ඩල තීරණ ක්ෂේත්‍රයට දන්වා යැවෙන අවසාන දිනය | : 2018.11.29 |

06. 2019.07.31 දිනට එක් එක් කොට්ඨාශයන් තුළ සිටින මැනුම් ක්ෂේත්‍ර සහායක සංඛ්‍යාව ශ්‍රේණි අනුව සඳහන් කර දිස්ත්‍රික් මාරු මණ්ඩල තීරණ දන්වා එවන අවස්ථාවේ දීම පළාත් සර්වේයර් ජනරාල්වරයා විසින් මා වෙත දන්වා එවිය යුතු ය. එම සංඛ්‍යා ලේඛන නියමිත වේලාවට ලැබීම, නියමිත දිනට මධ්‍යම මාරු මණ්ඩලය පවත්වා පළාත් තුළ අනුයුක්ත කිරීම සඳහා දන්වා එවීමට ඉමහත් පහසුවක් වන බව කාරුණිකව සලකන්න. 2019 වසර සඳහා අවශ්‍ය මැනුම් ක්ෂේත්‍ර සහායක සංඛ්‍යාව මා විසින් තීරණය කරනු ලැබේ.

07. මෙම චක්‍රලේඛයේ ඇතුළත් කරුණු ක්ෂේත්‍රයේ සියලු දෙනාගේ දැන ගැනීමට අවශ්‍ය කටයුතු කරන්න.

එස්.එම්.පී.පී. සංගක්කාර
සර්වේයර් ජනරාල්

එස්. එම්. පී. පී. සංගක්කාර
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී
..................... කොට්ඨාශය

<u>මැනුම් ක්ෂේත්‍ර සහායකයින්ගේ ස්ථාන මාරු අයදුම් පත්‍රය - 2020</u>

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :-
   ..........................................................................................
2. දෙපාර්තමේන්තු සේවා අංකය :-
   ..........................................................................................
3. පන්තිය හා ශ්‍රේණිය :- I ශ්‍රේණිය / II ශ්‍රේණිය / III ශ්‍රේණිය / විශේෂ ශ්‍රේණිය / ඕවර්සියර්
4. උපන් දිනය :- ............................................................
   2019.12.31 දිනට වයස -: අවුරුදු : ............ මාස : ............. දින : ....................
5. මුල් පත්වීමේ දිනය :- .............................................................
6. විවාහක / අවිවාහක බව :- .............................................................
7. යැපෙන්නන් පිළිබඳ විස්තර :-

| ඥාති සම්බන්ධය | වයස | වෙනත් විස්තර |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

8. ස්ථිර පදිංචි ලිපිනය :-
   ............................................................................................
9. සේවා ස්ථානයේ ලිපිනය :-
   ............................................................................................
10. පදිංචි ලිපිනය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-
    ..............................................................
11. සේවා ස්ථානය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :-
    ..............................................................
    (එකම දිස්ත්‍රික්කයේ වීම අවශ්‍ය නොවේ.)
12. දැනට සේවය කරන ස්ථානය :- ...........................................................
13. එහි සේවා කාලය (2019.12.31 දිනට) :- අවුරුදු : ............ මාස : ............ දින : ..............
14. වත්මන් සේවා ස්ථානයට පැමිණීමට පෙර සේවය කළ ස්ථාන පිළිවෙලින් දින වකවානු සහිතව :-

| කොට්ඨාශය | සේවා කාලය | ස්ථාන මාරු වී පැමිණි දිනය | ස්ථාන මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

15. ස්ථාන මාරු ඉල්ලීමට හේතු :-

I ..........................................................................................................
II ..........................................................................................................
III ..........................................................................................................

16. මාරු වී යාමට කැමති කොට්ඨාශ 03ක් පිළිවෙලින් (එකම ස්ථානය නොවිය යුතුය.) :-

I ......................................................................
II ......................................................................
III ......................................................................

17. වෙනත් කරුණු :-

..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

18. මුර සේවයේ යෙදීමට කැමති / අකමැති බව :- ...................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

............................................... ........................................
අයදුම්කරුගේ අත්සන දිනය

සේවා නිළධාරියාගේ නිර්දේශය :-

අත්සන :-
නම :-
තනතුර :-
දිනය :

ආදර්ශ ආකෘති පත්‍ර අංක 01

## ස්ථාන මාරු නිර්දේශ කරන /නොකරන මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්ගේ නාම ලේඛනය පන්තිය හා ශ්‍රේණිය

| නම හා දෙපාර්තමේන්තු අංකය | උපන්දිනය හා වයස | විවාහක/අ විවාහක භාවය | මුල් පත්වීම් දිනය | ස්ථිර පදිංචිය | ස්ථාන මාරු නිර්දේශකිරීමට/ නොකිරීමට හේතු | ස්ථානමාරුවීමට කැමති කොට්ඨාශ 03 පිළිවෙලින් | පෙර සේවා ස්ථාන 05 (දින වකවානු සහිතව) | වර්තමාන සේවා ස්ථානය හා එහි සේවාකාලය(2019.12.31) දිනට | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ආදර්ශ ආකෘති පත්‍ර අංක 02

## කොට්ඨාශයෙන් පිටතට අනිවාර්ය මාරු කරන මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්ගේ නාම ලේඛනය පන්තිය හා ශ්‍රේණිය

| නම හා දෙපාර්තමේන්තු අංකය | උපන්දිනය හා වයස | විවාහක/අවිවාහකභාවය | මුල්පත්වීම් දිනය | ස්ථිර පදිංචිය | පෙර සේවා ස්ථාන පිළිවෙලින් (දින වකවානු සහිතව) | වර්තමාන සේවා ස්ථානය හා එහි සේවාකාලය (2019.12.31) දිනට | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

ආදර්ශ ආකෘති පත්‍ර අංක 03

ආකෘති පත්‍ර 01 හා 02 ට නම් ඇතුළත් නොවූ මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන්ගේ නාම ලේඛනය

පන්තිය හා ශ්‍රේණිය

| නම හා දෙපාර්තමේන්තුඅංකය | උපන්දිනය හා වයස | විවාහක/අවිවාහක භාවය | මුල්පත්වීම් දිනය | ස්ථිර පදිංචිය | පෙර සේවා ස්ථාන පිළිවෙලින් (දින වකවානු සහිතව) | වර්තමාන සේවා ස්ථානය හා එහි සේවාකාලය (2019.12.31) දිනට |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |